# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 30 දරන කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය පනත

[සහතිකය සටහන් කළේ 1974 සැප්තැම්බර් මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ඔක්තෝබර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 30 දරන කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය පනත

[සහතිකය සටහන් කළේ 1974 සැප්තැම්බර් මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 5/74.

## කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය නීතිගත කිරීම සඳහා වූ පනතකි.

කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා කොළඹ මාලිගාවත්තේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කිපය මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද එම සංගමය නීති ගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 30 දරන කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමයේ තත්කාලයෙහි සිටින සභාපතිවරයා, උපසභාපතිවරුන් හා පාලක මණ්ඩලයේ සාමාජිකයන් ද එකී සංගමයේ දැනට සිටින යම් හා සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද "කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය" යන අභිධානය හා නාමය යටතේ අඛණ්ඩ පැවැත්මක් සහිත සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් සංස්ථාව විසින් සියලු අධිකරණයන්හි නඩු පැවරීම කළ යුතුවාක් මෙන් ම එසේ නඩු පැවරීම කළ හැකි ය. එමෙන්ම එයට විරුද්ධව ඒ නාමයෙන් නඩු පවරනු ලැබීම ද කළ යුතුවාක් මෙන් ම එසේ නඩු පවරනු ලැබිය හැකි ය. පොදු මුද්‍රාවක් තබා ගැනීමේත් පාවිච්චි කිරීමේත් ඔවුන්ගේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේත් බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය නීතිගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ මෙයින් මෙසේ ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(i) සමස්ත ලංකා තරුණ මුස්ලිම් සංගම් සම්මේලනයේ පොදු අරමුණු හා පරමාර්ථ වැඩි වර්ධනය කිරීම;

(ii) ජාතීන් අතර සමගිය වැඩීම;

(iii) මාලිගාවත්ත ප්‍රදේශවාසීන්ගේ තත්ත්වය, සමාජයීය, අධ්‍යාපනික හා ආර්ථික වශයෙන් දියුණු කිරීම;

(iv) ඉස්ලාම් ලබ්ධිය ප්‍රායෝගික වශයෙන් පිළිපැදීමට ධෛර්යය දීම; හා

(v) සමස්ත ලංකා තරුණ මුස්ලිම් සංගම් සම්මේලනයේ අරමුණු හා පරමාර්ථ සමග ගැලපෙන ලෙස සංගමය විසින් කලින් කල නිශ්චය කරනු ලබන අන් කිසි අරමුණක් හෝ පරමාර්ථයක්

යන මේවා සංස්ථාවේ පරමාර්ථ විය යුතු ය.

පාලක මණ්ඩලය.

4. (1) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීති අනුව තෝරා පත්කර ගනු ලබන සභාපතිවරයා, උපසභාපතිවරුන් දෙදෙනා, ගරු ප්‍රධාන ලේකම්, හා ගරු භාණ්ඩාගාරික ද හය දෙනකුට නො අඩු අන් සාමාජිකයන් ද යන මොවුන්ගෙන් සමන්විත වන පාලක මණ්ඩලයක් විසින්, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

රීති සෑදීමේ බලය.

5. සංස්ථාවේ සාමාජිකයන් ඇතුලත් කිරීම, අස් කිරීම හෝ නෙරපීම සඳහා ද සංස්ථාවේ පාලක මණ්ඩලයේ සහ, විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ හැසිරීම හා යුතුකම් සඳහා ද ව්‍යාපාර කටයුතු කිරීමේ අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින් සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමකදී එයට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය. ඒ රීති සාදනු ලැබීමෙන් පසු, සමාන රැස්වීමක දී, 7 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, හෝ අවලංගු කිරීම කළ හැකි ය.

උපලේඛනයෙහි දැක්වෙන රීති සංස්ථාවේ රීති විය යුතු බව.

6. 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙයට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන රීති සියලු කාර්යයන් සඳහා සංස්ථාවේ රීති විය යුතු ය:

එසේ වුව ද මේ වගන්තියේ කිසිවකින්, අලුත් රීති සෑදීමෙන් හෝ, උපලේඛනයෙහි දැක්වෙන (1 වන පරිච්ඡේදයේ 1 වන හා 2 වන වගන්ති හැර) හෝ සංස්ථාව විසින් මින් මතු සාදනු ලබන රීතිවලින් යමක් වෙනස් කිරීමෙන්, ඒවාට යමක් එකතු කිරීමෙන් හෝ ඒවා අවලංගු කිරීමෙන් සංස්ථාව වලක්වන්නක් ලෙස මින් මතු සෑම අවස්ථාවක්හිදී ම සැලකීම හෝ තේරුම් ගැනීම නො කළ යුතු ය.

රීති සෑදීමේ ක්‍රියා පටිපාටිය.

7. මෙයට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කිසිදු රීතියක් හෝ මින් මතු සම්මත කරනු ලබන කිසිදු රීතියක් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ

අවලංගු කිරීම, සංස්ථාවේ මහා සභාරැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් විනා හා ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම, හෝ අවලංගු කිරීම පාලක මණ්ඩලය විසින් කලින් අනුමත කරන ලද්දේ නම් මිස, නො කළ යුතු ය.

**8.** මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවත්නා සංස්ථාවේ සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට අයවිය යුතු සියලු ණය හා සංගමයට ගෙවිය යුතු සම්මාදම් හා දායක මුදල් මේ පනතේ කාර්ය යන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාවට අයවිය යුතු හා සංස්ථාවෙන් ගෙවිය යුතු ණය.*

**9.** යටත් පිරිසෙයින් පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකුවත් ඉදිරිපිටදී හැර කවර හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නො තැබිය යුතු අතර, තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ දෙදෙනා ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය. ඒ අත්සන් තැබීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් තැබීමෙන් බාහිරව විය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව තැබීමේ ක්‍රියා පරිපාටිය.*

**10.** යම් මිලට ගැනීමක, ප්‍රදානයක, තෑගිකිරීමක, අන්තිම කැමති පත්‍රයකින් බැහැර කිරීමක ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලබන චංචල සහ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා සතුව සිටීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව හා ශක්තතාව තිබිය යුතු අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් එය බැහැර කිරීමේ බලය සහිතව, එකී සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවට මේ පනතේ කාර්යයන් සඳහා එකී සියලු දේපළ සතුව සිටිය හැකි ය.

*සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ සතුව සිටිය හැකි බව.*

**11.** මේ පනතෙහි අඩංගු කිසිවක් ශ්‍රී ලංකා ජනරජයේ හෝ දේශ පාලන මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අන් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් කෙරෙහි, මේ පනතෙහි සඳහන් කරනු ලැබ ඒවා මාර්ගයෙන්, ඒවායින් හෝ ඒවා යටතේ හිමිකම් ඉදිරිපත් කරනු ලබන පරිදි හැර හානිකර නො විය යුතු ය; නැතහොත් බල නො පෑ යුතු ය.

*ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

## උපලේඛනය

### කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමයේ රීති

### I වන පරිච්ඡේදය

### නම, විෂය ප්‍රමාණය හා පරමාර්ථ

**1 වන වගන්තිය—නාමය**

මෙහි මින් මතු "සංගමය" යනුවෙන් හැඳින්වෙන සංගමයේ නාමය "කොළඹ මාලිගාවත්තේ තරුණ මුස්ලිම් සංගමය" විය යුතු ය.

**2 වන වගන්තිය—විෂය ප්‍රමාණය**

ඉස්ලාම් ලබ්ධියේ මූලධර්ම අනුව හොඳ ජීවිතයක් ගැඩගස්වන සියලු කටයුතු වලට සංගමය සහභාගී විය යුතු ය. පක්ෂ දේශපාලන කටයුතු නාගා සිදුවන කටයුතුවලින් වැළකී සිටිය යුතු ය.

3 වන වගන්තිය—අරමුණු හා පරමාර්ථ

සංගමයේ පොදු පරමාර්ථ—

(i) සමස්ත ලංකා තරුණ මුස්ලිම් සංගම් සම්මේලනයේ පොදු අරමුණු හා පරමාර්ථ නගා සිටුවීම;

(ii) ජාතීන් අතර සමගිය වැඩීම;

(iii) මාලිගාවත්ත ප්‍රදේශ වාසීන්ගේ තත්ත්වය, සමාජයීය, අධ්‍යාපනික හා ආර්ථික වශයෙන් දියුණු කිරීම;

(iv) ඉස්ලාම් ලබ්ධිය ප්‍රායෝගික වශයෙන් පිළිපැදීමට ධෛර්යය දීම;

(v) සමස්ත ලංකා තරුණ මුස්ලිම් සංගම් සම්මේලනයේ අරමුණු හා පරමාර්ථ සමග ගැලපෙන ලෙස සංගමය විසින් කලින් කල නිශ්චය කරනු ලබන අන් කිසි අරමුණක් හෝ පරමාර්ථයක්

යන මේවා විය යුතු ය.

4 වන වගන්තිය—කටයුතු

සංගමයේ කටයුතු පුළුල් වශයෙන් පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ:—

ආගමික,
අධ්‍යාපනික,
ශාස්ත්‍රීය,
සමාජ අභිවර්ධනය,
ක්‍රීඩා.

II වන පරිච්ඡේදය

සාමාජිකත්වය හා වරප්‍රසාද

1 වන වගන්තිය—සාමාජිකත්වය

සංගමයේ ත්‍රිවිධාකාර සාමාජිකත්වයක් තිබිය යුතු ය. එනම්,

(i) ගරු

(ii) සාමාන්‍ය

(iii) සාංගමික

යන ත්‍රිවිධාකාර සාමාජිකත්වයයි.

ගරු සාමාජිකත්වය

සංගමයේ කටයුතු කරගෙන යාමෙහි දී විශේෂ සේවයක් ඉටුකර සිටින මුස්ලිම් ජාතිකයකු මහා සභා රැස්වීමක දී ගරු සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

සාමාන්‍ය සාමාජිකත්වය

වයස අවුරුදු 18ක් වූ හා ඊට වැඩි ඕනෑම මුස්ලිම් ජාතිකයකුට සාමාන්‍ය සාමාජිකත්වය ලැබීමට හිමිකම් ඇත.

සාංගමික සාමාජිකත්වය

සංගමයේ කටයුතුවලට සහභාගිවීමට කැමැති මුස්ලිම් ජාතිකයකු නොවන ඕනෑම කෙනකුට සාංගමික සාමාජිකත්වය ලැබීමට හිමිකම් ඇත.

2 වන වගන්තිය—වරප්‍රසාද

ස්වකීය සාමාජිකත්ව වර්ගය ගැන නොතකා පවත්නා සියලු වරප්‍රසාද භුක්ති විඳීමට සියලුම සාමාජිකයන්ට හිමිකම් තිබිය යුතු ය. එසේ වුව ද ඡන්දය දීමේ හා ධුර දැරීමේ අයිතිය සාමාන්‍ය සාමාජිකයන්ට පමණක් සීමා කළ යුතු ය.

3 වන වගන්තිය—සාමාජිකත්වය සඳහා ඉල්ලීම්

සාමාජිකත්වය සඳහා වූ සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතියෙහි ඉදිරිපත් කරනු ලැබිය යුතුවත් හැර සංගමයේ සාමාන්‍ය සාමාජිකයන් විසින් යෝජනා හා ස්ථිර කරනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීම රුපියල් 1 ක ඇතුළත්වීමේ ගාස්තුවක් හා කලින් එවිය යුතු මාසයක සාමාජික මුදලක් සමග ගරු ප්‍රධාන ලේකම් වෙත ලැබිය යුතු ය.

**4 වන වගන්තිය—සාමාජික මුදල්**

සාමාන්‍ය හා සාංගමික සාමාජිකයන් විසින් මසකට ශත පනහ බැගින් වූ සාමාජික මුදලක් ගෙවිය යුතු ය. මසකට ශත පනහ බැගින් වූ නියමිත ප්‍රමාණයට වැඩි සාමාජික මුදලක් ගෙවීමට සාමාජිකයන්ට නිදහස තිබේ.

**5 වන වගන්තිය—හිඟ සාමාජික මුදල්**

තුන් මසකට වැඩි කාලයක් සාමාජික මුදල් හිඟ තබා සිටින සාමාජිකයන්ගේ නාම ලැයිස්තුවක් පාලක මණ්ඩලය විසින් කලින් කල කැඳවිය යුතු ය. ඉක්බිතිව හිඟ සාමාජික මුදල් අයකර ගැනීමට හෝ සාමාජිකත්වය අවසන් කිරීමට ක්‍රියා කරනු ලැබේ. එවැනි යම් සාමාජිකයකු නැවත බඳවා ගැනීම සියලු හිඟ සාමාජික මුදල් ගෙවීමට යටත්ව විය යුතු ය.

එසේ වුව ද විශේෂ අවස්ථා යටතේ ඒ සම්පූර්ණ හිඟ මුදල හෝ ඉන් කොටසක් අත්හැරීමට පාලක මණ්ඩලයට බලය පවරනු ලැබේ.

**6 වන වගන්තිය—සාමාජිකයන් අත්හිටුවීම**

සභාපති හා ගරු ලේකම් විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් පසු යම් සාමාජිකයකුගේ හැසිරීම සංගමයේ උන්නතියට හානිකර යයි තීරණය වුවහොත් ඔහුගේ සාමාජිකත්වය අත්හිටුවීම සඳහා හෝ ඔහු නෙරපීම සඳහා පාලක මණ්ඩලය වෙත ඔහු වාර්තා කරනු ලැබිය යුතු ය. පාලක මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතු ය.

## III වන පරිච්ඡේදය

### අනුශාසක, උප අනුශාසක, නිලධරයන් යනාදීහු

**1 වන වගන්තිය—අනුශාසක**

වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත් කරනු ලැබිය යුතු අනුශාසකවරයකු සිටිය යුතු ය.

**2 වන වගන්තිය—උප අනුශාසකයන්**

වාර්ෂික මහා සභා රැස්වීමක දී තෝරා පත්කරනු ලැබිය යුතු උප අනුශාසකවරුන් තිදෙනකු සිටිය යුතු ය.

**3 වන වගන්තිය—පාලක මණ්ඩලය**

වාර්ෂික මහා සභා රැස්වීමක දී තෝරා පත්කරනු ලැබිය යුතු සංගමයේ සාමාජිකයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත වන පාලක මණ්ඩලයක් සිටිය යුතු ය.

**4 වන වගන්තිය**

සංගමයේ පිළිවෙලින් සභාපතිවරයකු, උප සභාපතිවරුන් දෙදෙනකු, ගරු ලේකම්වරයකු හා ගරු භාණ්ඩාගාරිකයකු සිටිය යුතු ය. ඔවුන් පාලක මණ්ඩලයේ සාමාජිකයන් එකොළොස්දෙනා අතුරෙන් තෝරා පත්කරනු ලැබිය යුතු ය.

**5 වන වගන්තිය**

සංගමයේ සභාපති පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් ද ක්‍රියා කළ යුතු ය.

**6 වන වගන්තිය**

පාලක මණ්ඩලය විසින් එහි පළමු රැස්වීමේ දී පත්කරනු ලැබිය යුතු ගරු විගණකයකු සිටිය යුතු ය.

**7 වන වගන්තිය**

වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ ඉන් පසුව පාලක මණ්ඩලය විසින් තෝරා පත්කරගත් නිලධරයකු ඔහු කලින් ධුරයෙන් ඉල්ලා අස්වන්නේ නම් හෝ ඡන්දයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, ඊළඟට එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීම තෙක් ධුර දැරිය යුතු ය.

8 වන වගන්තිය

පාලක මණ්ඩලය විසින්, නිශ්චිත කාර්යයන් සඳහා අවශ්‍ය කවර විටක දී වුව තත් කාර්ය සමිති පත් කළ හැකි ය.

9 වන වගන්තිය

මියයාම, ඉල්ලා අස්වීම හෝ අන් කිසි හේතුවක් නිසා පාලක මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් වුවහොත් ඒ පුරප්පාඩුව පාලක මණ්ඩලය විසින් සාමාන්‍ය සාමාජිකයන් අතුරෙන් පිරවිය යුතු ය.

10 වන වගන්තිය

පාලක මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට සෑහෙන හේතුවක් නොමැතිව නොපැමිණි එකී මණ්ඩලයේ යම් සාමාජිකයකු, තම ධුරය හිස් කර සිටින ලෙස සලකනු ලැබේ.

11 වන වගන්තිය

සභාපති, ගරු ප්‍රධාන ලේකම් හා ගරු භාණ්ඩාගාරික මැතිවරණයකට ඉදිරිපත් වීමෙන් හෝ යම් විශේෂ පක්ෂයකට හෝ පක්ෂවලට හෝ යම් අපේක්ෂකයකුට හෝ අපේක්ෂකයන්ට ඡන්දය දෙන මෙන් මහජනයාට කරුණු කියාදීමෙන් පක්ෂ දේශපාලන කටයුතුවල සක්‍රිය ලෙස නො යෙදිය යුතු ය. සභාපති හෝ ගරු ප්‍රධාන ලේකම් හෝ ගරු භාණ්ඩාගාරික පක්ෂ දේශපාලන කටයුතුවලට සක්‍රිය ලෙස සහභාගිවීමට අදහස් කරයි නම්, යම් තෝරා පත් කර ගැනීමක් සඳහා නියම කරනු ලැබූ දිනයට තිස් දිනකටවත් කලින් ධුරයෙන් ඉල්ලා අස්විය යුතු ය. ඒ ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් සුදුසු පරිදි ප්‍රචාරය කරනු ලැබිය යුතු ය.

12 වන වගන්තිය

ඉහතින් වූ වගන්තිය යටතේ ඉල්ලා අස්වන සභාපති හෝ ගරු ප්‍රධාන ලේකම් හෝ භාණ්ඩාගාරික, හිස් කළ තනතුර තෝරා පත් කර ගැනීමේ දිනයෙන් පසු අනුක්‍රමික දින තිහක් තුළ නො පුරවනු ලැබ පවතියි නම් හිස් කළ ඒ තනතුරට නැවත තෝරාපත් කරනු ලැබීමට ඔහු සුදුසු වන්නේ ය.

## IV වන පරිච්ඡේදය

## රැස්වීම්

1 වන වගන්තිය—සංගමයේ රැස්වීම්

වාර්ෂික මහා සභා රැස්වීම වර්ෂයේ මුල් මාස තුන ඇතුළත පවත්වනු ලැබිය යුතු ය. යටත් පිරිසෙයින් දින දහහතරකටවත් කලින් ඒ රැස්වීම පිළිබඳ දැන්වීම කරනු ලැබිය යුතු ය. ගණපූරණය සාමාජිකත්වයෙන් හතරෙන් එකක් විය යුතු ය.

පාලක මණ්ඩලයේ ඉල්ලීම අනුව හෝ සංගමයේ සාමාජිකයන්ගෙන් පසළොසකට නොඅඩු සාමාජිකයන් ගණනකගේ ඉල්ලීම අනුව විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය. විශේෂ රැස්වීමක් පිළිබඳ දැන්වීම යටත් පිරිසෙයින් දින තුනකටවත් කලින් කරනු ලැබිය යුතු අතර රැස්වීමේ ගණපූරණය සාමාජිකත්වයෙන් හතරෙන් එකක් විය යුතු ය.

2 වන වගන්තිය—පාලක මණ්ඩලයේ රැස්වීම්

(අ) පාලක මණ්ඩලයේ සාමාන්‍ය රැස්වීමක් මසකට වරක්වත් පවත්වනු ලැබිය යුතු ය. එකී රැස්වීම පිළිබඳව දින අටකවත් දැන්වීමක් කළ යුතු ය. ඒ රැස්වීමේ ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(ආ) හදිසි අවශ්‍යතාවක් වුවහොත් කෙටි දැන්වීමකින් මණ්ඩලය රැස්විය යුතු ය. ඒ සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

## V වන පරිච්ඡේදය

## මුදල්

1 වන වගන්තිය—ලැබීම් හා ගෙවීම්

(අ) සංගමයට ලැබෙන සියලු මුදල් සම්බන්ධයෙන් තම අත්සන යටතේ රිසිට් පතක් නිකුත් කළ යුතු ගරු භාණ්ඩාගාරික විසින් එකී මුදල් ලැබුණු බව දැන්විය යුතු ය.

(ආ) සියලුම ගෙවීම්, ගෙවීම් සහතිකයකින් සනාථ කරනු ලැබිය යුතු අතර එසේ වියදම් වූ මුදල රුපියල් විස්සකට අඩු වුවහොත් පාලක මණ්ඩලය විසින් ඊළඟ රැස්වීමේ දී එය අනුමත කරනු ලැබිය යුතු ය.

(ඇ) රුපියල් විස්සට වැඩි සියලු ගෙවීම් සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ පූර්ව අනුමතිය ලබා ගත යුතු ය.

(ඈ) ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශයක්, පාලක මණ්ඩලයේ අනුමතිය ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ලැබී ඇත් නම්, දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

### දේපළ හා අරමුදල් පිළිබඳ පාලනය හා පරිපාලනය

**1 වන වගන්තිය—දේපළ හා අරමුදල් සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ බලතල**

(අ) පාලක මණ්ඩලයට සංගමයේ හෝ සියලු දේපළ හා අරමුදල් පිළිබඳ සාමාන්‍ය පාලනය හා කළමනාකරණය තිබිය යුතු අතර, සංගමයේ කාර්යයන් සඳහා පාලක මණ්ඩලය විසින්—

(i) රුපියල් එක් දහසකට නො වැඩි වටිනාකමකින් යුත් චංචල දේපළ බැහැර කළ හැකි ය.

(ii) සංගමයේ සාමාන්‍ය වියදම්වලට අතිරේකව, මහා සභා රැස්වීමක හෝ භාරකාර මණ්ඩලයේ බලය නොමැතිව ඕනෑම එක් වර්ෂයක් තුළ රුපියල් පන් දහසකට නොවැඩි අතිවිශේෂ වියදමක් දැරිය හැකි ය.

(ආ) මේ වගන්තියෙහි විධිවිධාන සලස්වනු ලැබූ පරිදි හැර, සංගමයේ යම් නිශ්චල දේපළක් බැහැර කරන හෝ සංගමයේ චංචල දේපළ හෝ අරමුදල් පවරන හෝ සංගමය වගකීමකට හෝ හිමිකම් කියා පෑමකට යටත් කරන පාලක මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් සියලුම සාමාජිකයන් වෙත ලියවිල්ලකින් යථා පරිදි දැන්වීමක් කිරීමෙන් පසු වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමක දී ඒ ක්‍රියාව සඳහා බලය පවරනු ලැබ, මේ රීතිවල විධිවිධාන සලස්වනු ලබන පරිදි භාරකාර මණ්ඩලයේ රැස්වීමක දී ඡන්දය දෙන භාරකරුවන්ගේ වැඩි ඡන්දයෙන් ඒ බලයදීම අනුමත කරනු ලැබුවේ නම් මිස, වලංගු හෝ බලසහිත නො විය යුතු ය.

## VII වන පරිච්ඡේදය

### භාරකාර මණ්ඩලය

**1 වන වගන්තිය—දේපළ ආරක්ෂාව**

සංගමයට අයත් සියලුම නිශ්චල දේපළ පිළිබඳ ආරක්ෂාව භාරකරුවන් තිදෙනකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් වෙත සතු කළ යුතු ය.

**2 වන වගන්තිය—භාරකරුවන් තෝරා පත් කිරීම**

(අ) වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී සිටපු සභාපතිවරුන් අතුරින් භාරකරුවන් තෝරා පත් කරනු ලැබිය යුතු අතර ඔවුන් අවුරුදු පහක කාලයකට ධුර දැරිය යුතු ය.

(ආ) ඉක්බිතිව භාරකරුවන් අතර ඇතිවන පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු, ඒ පුරප්පාඩුව හෝ පුරප්පාඩු ඇති වීමෙන් තුන්මසක කාලයක් ඇතුළත විශේෂ මහා සභාරැස්වීමක දී පුරවනු ලැබිය යුතු ය; එසේ තෝරා පත්කරගනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසින්, නියමිත කාලයෙන් ගත නොවූ කාලපරිච්ඡේදය තුළ පමණක් ධුර දැරිය යුතු ය.

**3 වන වගන්තිය—භාරකරුවකු වශයෙන් තෝරා පත්වීම සඳහා නුසුදුසුකම්**

**කිසිම තැනැත්තකු—**

(අ) ඔහු සංගමයේ සාමාජිකයකු හා සිටපු සභාපතිවරයකු නොවේ නම්;

(ආ) ඔහු මුස්ලිම් ජාතිකයකු නොවේ නම්; හෝ

(ඇ) ඔහු වයස අවුරුදු තිස්පහට අඩු නම්; හෝ

(ඈ) ඔහු, නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින්, වස්තුභංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු වශයෙන් ප්‍රකාශ කරනු ලැබ ඒ වස්තුභංගත්ව හෝ බුන්වත් භාවයෙන් නිදහස් නොවූවෙක් නම්; හෝ

(ඉ) ඔහු, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් අපරාධ චෝදනාවක් ලබා වරදකරු කරනු ලැබූවෙක් නම්; හෝ

(ඊ) ඔහු සිහි විකල් වූවෙක් නම්

භාරකරුවකු වශයෙන් තෝරා පත්කරගනු ලැබීමට හෝ භාරකරුවකු වශයෙන් රැඳී සිටීමට නුසුදුසු විය යුතු ය.

**4 වන වගන්තිය—භාරකාර මණ්ඩලයේ බලතල**

(අ) මේ රීතිවල VI වන පරිච්ඡේදයේ 1(ආ) වන වගන්තිය ක්‍රියාත්මක වීමෙන් භාරකාර මණ්ඩලයේ අනුමතිය අවශ්‍යවන යම් දේපළ බැහැර කිරීමක් හෝ අරමුදල් ආයෝජනය කිරීමක් හෝ අන් ගණුදෙනුවක් සම්බන්ධයෙන් නම් අනුමතිය දීමේ හෝ අනුමතිය දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය භාරකාර මණ්ඩලයට තිබිය යුතු ය.

(ආ) සංගමය සඳහා යම් නිශ්චල දේපළක් මිලට ගැනීමේ සහ සංගමයට අයත් නිශ්චල දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ හෝ අන් ආකාරයකින් අන් සතු කිරීමේ බලය භාරකාර මණ්ඩලය වෙත සතු කරනු ලැබිය යුතු අතර භාරකාර මණ්ඩලය විසින් ඒවා ක්‍රියාත්මක කළ යුතු ය. එසේ වුව ද එකී මිලට ගැනීම, විකිණීම, උකස් කිරීම, බද්දට දීම හෝ අන්සතු කිරීම අනුමත කරන පාලක මණ්ඩලයේ යෝජනා සම්මතයක් නොමැතිව එකී බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

**5 වන වගන්තිය—ගණුදෙනු සම්බන්ධයෙන් නිලධාරීන්ගේ යුතුකම්.**

මේ රීතිවල VI වන පරිච්ඡේදයේ 1 වන වගන්තිය අනුව භාරකාර මණ්ඩලයේ අනුමතිය අවශ්‍ය කරන සංගමයේ දේපළවලට බලපාන යම් ගණුදෙනුවක් පිළිබඳ යම් ලේඛනයකට, කිසිම නිලධරයකු විසින්, ඒ ගණුදෙනුව සඳහා භාරකාර මණ්ඩලයේ අනුමතිය ලියවිල්ලකින් යථා පරිදි ලබාගත් බවට ඔහු පළමුවෙන් සෑහීමට පත්වන්නේ නම් මිස, තම අත්සන නො තැබිය යුතු ය.

## VIII වන පරිච්ඡේදය

### විවිධ කරුණු

**1 වන වගන්තිය—රීති සංශෝධනය කිරීම**

සංගමයේ මහා සභාරැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන්, 1 වන පරිච්ඡේදයේ 1 වන හා 2 වන වගන්ති හැර, මේ රීති සංශෝධනය කළ හැකි ය:

එසේ වුව ද පාලක මණ්ඩලය විසින් ඒ සංශෝධන කලින් අනුමත කරනු ලැබිය යුතු ය.

**2 වන වගන්තිය—රීති අර්ථ නිරූපණය කිරීම**

මේ රීති අර්ථ නිරූපණය කිරීම හෝ මේ රීතිවල නිශ්චිතව විධිවිධාන සලස්වා නැති යමක් හෝ සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතු ය.